

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

Lakdiva Engineering Company (Pvt) Ltd

லக்திவ என்ஜினியரிங் (பிரைவேட்) லிமிட்டட

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

2016

දැක්ම

ශ්‍රී ලංකා වාසී ජනතාවට වඩා හොඳ ආකර්ශනීය ප්‍රවාහන සේවාවක් සඳහා දායක වීම.

මෙහෙවර

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලංගම) සහ පෞද්ගලික බස් හිමියන්ගේ බස් රථ සහනදායී මිලකට සහ උසස් තත්ත්වයෙන් අලුත්වැඩියා කිරීම.

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ කාර්යාලය

නීතිමය තත්ත්වය	-2007 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත.
සංස්ථාගත කිරීමේ දිනය	- 2001 ඔක්තෝබර් 01
සමාගම ලියාපදිංචි අංකය	**- PV21948**
කාර්යාලයේ ලිපිනය	-සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ කාර්යාලය අංක 73, මිනුවන්ගොඩ පාර, ඒකල, ජා-ඇල
දුරකථන අංකය	- 0112236530 / 0112230458
විද්‍යුත් තැපැල් ලිපිනය	**- lakdiwaengco@gmail.com**

පටුන

	පිටු අංකය
හැඳින්වීම	1
සභාපතිතුමාගේ පණිවිඩය	2
සාමාජිකයන්	3
අරමුණු	4
කාර්ය සාධනය	5 - 7
ක්‍රියාකාරකම් හා වගකීම්	8
වාර්ෂික ගිණුම්	9 - 25
විගණකාධිපති වාර්තාව	26 - 27
විගණකාධිපති වාර්තාව සඳහා ගත් ක්‍රියාමාර්ග	28

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

හැඳින්වීම

1957 අංක 48 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 25 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව එවකට ප්‍රවාහන අමාත්‍යවරයා වූ ගරු ලෙස්ලි සයිමන් ගුණවර්ධන මහතා 1970.11.20 දින අංක 14933 දරන රජයේ ගැසට් පත්‍රයේ නියෝගයක් ප්‍රකාශයට පත් කිරීම මගින් ඔටෝමොබයිල් පුද්ගලික (ලංකා) ලිමිටඩ් නමට තිබූ අක්කර 24 ක වපසරියකින් යුත් ඉඩමක් ලංකා ගමනාගමන මණ්ඩලයේ භාවිතය සඳහා පවරා දෙමින් මෙම ආයතනය ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත.

එහිදී ඒකල මධ්‍යම වැඩපළ 1974.02.15 වැනි දින එවකට සමගි පෙරමුණු රජයේ අගමැතිනිය වූ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ මහ පෙන්වීමෙන් ආරම්භ කරන ලදී.

ආරම්භයේ සිටම මෙම ආයතනය අලුත් බස් රථ බඳ අළුත්වැඩියාව මෙන්ම පරණ බස් රථ බඳ අළුත්වැඩියාවද මූලික වශයෙන් සිදුකරනු ලබයි. මෙම වැඩපළ අංශ දෙකකින් සමන්විත වන අතර, එක් වැඩපලක් මධ්‍යම වැඩපළ ලෙස ක්‍රියාත්මක වූ අතර, ඒකල වැඩපළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් විය.

ජනතාකරණ වැඩපිළිවෙල යටතේ 1993.06.14 දින මෙම වැඩපළවල් දෙකම ඒකාබද්ධ කර ඒකල ඉන්ජිනේරු කටයුතු පිලිබඳ පුද්ගලික සමාගමක් ලෙස පෞද්ගලීකරණය කරන ලදි.

පසුව මෙම පුද්ගලික සමාගම චීනයෙන් ආනයනය කරන ලද ග්‍රේට්වෝල් බස් 400 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. ඒ අනුව 2001 වර්ෂයේ සිට ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන රජයට අනුබද්ධ සමාගමක් ලෙස ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම ලෙස එය කළමනාකරණය කරන ලදි. තවද ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීමේ අරමුණින් පුහුණු තරුණ තරුණියන් සම්බන්ධ කරගනිමින් රටට අවශ්‍ය බස් රථ බඳ තැනීමට මෙම ආයතනය කටයුතු කරයි.





සභාපතිතුමාගේ පණිවිඩය



2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව එළිදැක්වීමට සුබපැතුම් පණිවිඩයක් සහ අදහසක් එක් කිරීමට ලැබීම මගේ භාග්‍යයක්. මගේ ඒකායන අපේක්ෂාව වන්නේ අමාත්‍යවරයාගේ, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහයෝගීතාවය ඇතිකරමින් ආයතනයේ ඵලදායිතාවය සහ ආදායම ඉහළ නැංවීමයි. එසේම, සේවකයන් මුහුණපා ඇති ගැටළු හැකි ඉක්මනින් විසඳා නිෂ්පාදනය ඉහළ නැංවීමෙන් දිරිමත් කළ හැකි බව මගේ හැඟීමයි. එය තවදුරටත් ඉදිරියට ගෙන යාම අපගේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අපේක්ෂාව ද වේ.

විශේෂයෙන්ම මා අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රධානීන් හමුවී ඔවුන්ගේ අමාත්‍යාංශවලට අයත් වාහනවල අලුත්වැඩියා කටයුතු සහ අප ආයතනය මඟින් සපයනු ලබන අනෙකුත් සේවාවන් සිදු කළ අතර මගේ දැක්ම වන්නේ ලක්දිව සමාගම පහසුවෙන් ගෙනයා හැකි ආයතනයක් කරවීම වේ. මට උපදෙස් හා මගපෙන්වීම් ප්‍රවාහන අමාත්‍ය ගරු. නිමල් සිරිපාල ද සිල්වා, නියෝජ්‍ය අමාත්‍ය අශෝක් අබේසිංහ මහතා ඇතුළු සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ අනෙකුත් නිලධාරීහු විසින් ලබාදෙන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකරණ කණ්ඩායමට ඔවුන්ගේ කැපවීම සහ සමාගමට දැක්වූ පක්ෂපාතීත්වය සඳහා මම ප්‍රශංසා කරමි. අපගේ සේවකයින් සමාගම සඳහා ඔවුන්ගේ කැපවීම නැවත නැවතත් ඔප්පු කරමින් ඔරොත්තු දීම, අපගේ වටිනා ගැනුම්කරුවන්ට, සැපයුම්කරුවන්ට සහ ව්‍යාපාරික හවුල්කරුවන්ට ඔවුන්ගේ අගනා සහයෝගය සහ පක්ෂපාතිත්වය වෙනුවෙන් ස්තූති කිරීමටද මම කැමැත්තෙමි.

බී.ආර්.එල්. ගුණවර්ධන
සභාපති,
සීමාසහිත ලක්දිව ඉංජිනියරින් (පුද්ගලික) සමාගම,
ඒකල, ජා-ඇල.

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ සාමාජිකයන්

අධ්‍යක්ෂ මණ්ඩලය	: බී.ආර්.එල්. ගුණවර්ධන මහතා	- සභාපති
	කේ.එස්.එම්.ද සිල්වා මහතා	- අධ්‍යක්ෂ
	සරත් ඇපා මහතා	- අධ්‍යක්ෂ
	ඒ.එම්.ආර්.ජේ.කේ. ජයසිංහ මහතා	- අධ්‍යක්ෂ
	ජී. අජිත් ප්‍රියන්ත මහතා	- අධ්‍යක්ෂ
	හේමන්ත රාජපක්ෂ මහතා	- සමාගමේ ලේකම්
කාර්යමණ්ඩලය	: කේ.එස්. අනුර කුමාර මහතා	- ඉංජිනේරු
	ජේ. අමරදිවාකර මහතා	- පරිපාලන නිලධාරී
	ගයාන් චන්ද්‍රසිරි මහතා	- ගණකාධිකාරී
	මංජුල සම්පත් මහතා	- ගිණුම් නිලධාරී
	එල්. විජේරත්න මහතා	- සැපයුම් නිලධාරී
	සජිත් රවින්ද්‍ර මහතා	- සභාපති ලේකම්

අරමුණු

- ❖ ශ්‍රී ලංගම බස් රථ සාමාන්‍ය ජනතාවට අඩු මිලට සහ උසස් ප්‍රමිතියෙන් ලබා දීම.

- ❖ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් පුහුණු ශ්‍රමිකයන් වැඩි දියුණු කිරීම.

- ❖ වාහන පරීක්ෂා කිරීම, රියදුරු මෝටර් යාන්ත්‍රණය පිලිබඳ පුහුණුව හා අනෙකුත් ආශ්‍රිත ක්ෂේත්‍ර වල ව්‍යාපාර කරගෙන යාම.

- ❖ කළමණාකරන උපදේශකයින්, හවුල් ව්‍යාපාර නියෝජිතයන් සහ නියෝජිතයන් ලෙස සේවා සැපයීම.

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ 2016 වර්ෂය තුල කාර්ය සාධනය


ආයතනික පාලනය

සී/ස ලක්දිව ඉංජිනේරු සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය, ආයතනික පාලනයේ ඉහළ ප්‍රමිතීන්ගෙන් පවත්වාගෙන යාමට කැපවී වගකීම දරයි. සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම විසින් එහි ආයතනික පාලන ප්‍රතිපත්ති සහ භාවිතයන් සැලසුම් කර ඇත්තේ සමාගම දිගුකාලීන කොටස් හිමියන්ගේ වටිනාකමක් නිර්මාණය කිරීම වෙනුවෙන් තම පාර්ශවකරුවන් වෙත තම වගකීම් කෙරෙහි අවධානය යොමු කර ඇති බව සහතික කිරීම සඳහා වේ.

සමාගම කොටස් හිමියන්, සේවකයින්, සැපයුම්කරුවන්,පාරිභෝගිකයින් සහ එය ක්‍රියාත්මක වන අනෙකුත් ප්‍රජාවන් ඇතුළුව එහි සියළුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගනී. මීට අමතරව ආයතනික පාලන පද්ධතිය තුල සමාගම් පණතේ අවශ්‍යතා ද සලකා බලනු ලැබේ. මෙම ප්‍රකාශය මඟින් මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ආයතනික පාලන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ක්‍රියාවලි දක්වා ඇත. මණ්ඩල අධ්‍යක්ෂකවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් එක් අයෙක් විධායක අධ්‍යක්ෂකවරයෙකු වන අතර, අනෙක් සිව්දෙනා විධායක නොවන අධ්‍යක්ෂකවරුන් වේ.

වර්ෂය තුල මණ්ඩලය අවම වශයෙන් අවස්ථා හතරකදී රැස්විය. සෑම රැස්වීමකටම පෙර සමාගමේ කාර්ය සාධනය, නව ආයෝජන, ප්‍රාග්ධන ව්‍යාපෘති සහ විශේෂිත මණ්ඩල අනුමැතිය අවශ්‍ය වන වෙනත් ගැටළු පිලිබඳව මණ්ඩල පත්‍රිකා කල්තියා දැනුවත් කිරීම් සිදුකර තීරණ සක්‍රීය කිරීම සඳහා න්‍යාය පත්‍රයට අදාල සියළුම කළමණාකරන තොරතුරු සහ පසුබිම් ද්‍රව්‍ය අධ්‍යක්ෂකවරුන්ට සපයනු ලැබේ. සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂකවරුන්, කොටස් හිමියන් සහ බාහිර පාර්ශවකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්වීම, ප්‍රතිපත්ති සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් සභාපති වගකිව යුතුය. සමස්ථ වාණිජ, මෙහෙයුම් සහ උපායමාර්ගික සංවර්ධනය සඳහා ඔහු වගකිව යුතුය.


සන්ධිස්ථාන


ඒකල මධ්‍යම වැඩපලේ ආරම්භය
1974
ඒකල ඉංජිනේරුමය කාර්යයන් පුද්ගලීකරණය
1993
සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම සංස්ථාපනය
2001
අළුත්වැඩියා කිරීමේ බස් රථ සංඛ්‍යාව වැඩි කිරීම
2014
ලාභ උත්පාදනය ආරම්භ කිරීම
2016

මූල්‍යමය විශේෂ අවස්ථා


ආදායම (රු. මිලියන)

වර්ෂය	2014	2015	2016
අළුත්වැඩියා ආදායම	24	35	73




අළුත්වැඩියා කරන ලද බස්රථ සංඛ්‍යාව

වර්ෂය	2014	2015	2016
අළුත්වැඩියා කරන ලද බස්රථ (ප්‍රමාණය)	42	49	69




මුළු වත්කම් (රු. මිලියන)

වර්ෂය	2014	2015	2016
මුළු වත්කම්	34	35	43



බදු පසු ලාභය (රු. මිලියන)

වර්ෂය	2014	2015	2016
බ.ප.ලා	(4.04)	0	5.08



ක්‍රියාකාරකම් සහ වගකීම්

මූල්‍ය වාර්තාකරණය

මෙම ක්‍රියාවලියේ විශ්වසනීයත්වය සහ අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අනුකූලතාව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණයට ප්‍රමිති සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධානට අනුකූල වීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය සහ බාහිර විගණකවරුන් සමඟ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සමාගම විසින් අනුගමනය කරන ලද මූල්‍ය වාර්තාකරණ ක්‍රමය කමිටුව විසින් සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

අවදානම් සහ පාලනයන්

කමිටුව විසින් එක් එක් ව්‍යාපාරික අංශය සඳහා ගනු ලැබූ හෝ සලකා බැලූ ප්‍රධාන ව්‍යාපාරික අවදානම් සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ලබාගෙන සමාලෝචනය කරන ලදී. සමාගම. විශේෂයෙන්ම, කම්කරු ගැටළු, වැටුප් වැඩිවීම් ආදියෙන් සමාගමට පැන නගින මූල්‍යමය බලපෑම් පිළිබඳව කමිටුව විසින් සාකච්ඡා කර, සුදුසු පරිදි මණ්ඩලය ඇගයීමට ලක් කරන ලදී.

අභ්‍යන්තර විගණනය

සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යය ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා විසින් සිදු කරන ලදී. කමිටුව විසින් අභ්‍යන්තර විගණකවරුන්ගේ සොයාගැනීම් සහ ඔවුන්ගේ නිර්දේශ කළමනාකරණ ප්‍රතිචාර සමඟ සමාලෝචනය කළ අතර සමස්ථ පාලන පරිසරය වැඩිදියුණු කිරීම සඳහා එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරන්තරයෙන්ම පසු විපරම් කළේය.

බාහිර විගණනය

සමාගමේ විෂය පථය සහ විගණන උපාය මාර්ගය සහ සමාගමේ සුමට ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් සාධක පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විගණන කමිටුව බාහිර විගණකවරුන් හමුවිය.

නිගමනය

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙහෙයුම් පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් මඟින් සමාගමේ කටයුතු ප්‍රකාශිත ප්‍රතිපත්තිවලට අනුකූලව කළමනාකරණය කරන බවට සාධාරණ සහතිකයක් ලබා දෙන අතර සමාගමේ වත්කම් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත්වේ

අත්සන් කළේ.
කේ.එස්.එම්.ද සිල්වා මහතා,
සභාපති,
විගණන කමිටුව
2019-07-01

වාර්ෂික ගිණුම් 2016

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනට

	සටහන්	31.12.2016 රු.	31.12.2015 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ		13,435,435	8,290,423
ස්ථාවර තැන්පතු		2,885,199	2,839,031
		16,320,634	11,129,454
ජංගම වත්කම්			
තොග	4	15,493,432	16,272,702
වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	5	10,486,133	4,904,195
තැන්පතු හා අත්තිකාරම්	6	728,076	2,356,376
මුදල් හා මුදල් සමාන දෑ	7	50,095	30,000
		26,757,736	23,563,273
මුළු වත්කම්		43,078,370	34,692,727
හිමිකම් හා වගකීම්			
හිමිකම්			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	8	20	20
ප්‍රාග්ධන සංචිත		33,293,621	33,293,621
සමුච්චිත සංචිත		(15,582,459)	(20,668,325)
		17,711,182	12,625,316
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් - පාරිතෝෂික	9	18,109,704	2,365,893
ජංගම වගකීම්			
ගෙවිය යුතු වෙළෙඳ හා අනෙකුත් දෑ	10	3,667,200	17,585,129
බැංකු අයිරා		3,590,284	2,116,389
		7,257,484	19,701,518
මුළු හිමිකම් හා වගකීම්		43,078,370	34,692,727

01 සිට 21 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්යය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

සභාපති

CHAIRMAN
GOVERNMENT OWNED
LAKDIVA ENGINEERING CO. (PVT) LTD
EKALA, JA-ELA.

අධ්‍යක්ෂක

Director
LAKDIWA ENGINEERING COMPANY (PVT) LTD
No. 73, Minuwangoda R...
Ekala, Jaela.

ගණකාධිකාරී

Accountant
Government owned
LAKDIVA ENGINEERING COMPANY (PVT) LTD

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2016 රු.	2015 රු.
ආදායම	11	73,340,474	34,657,779
විකුණුම් පිරිවැය	12	(64,569,598)	(37,904,747)
දළ අලාභය		8,770,876	(3,246,968)
අනෙකුත් ආදායම්	13	24,512,359	22,566,326
		33,283,235	19,319,358
පරිපාලන වියදම්	14	(27,474,024)	(18,980,529)
බෙදාහැරීමේ පිරිවැය	15	(672,127)	(126,269)
මූල්‍ය පිරිවැය	16	(51,218)	(212,152)
බදු පෙර ලාභය		5,085,866	408
ආදායම් බදු වියදම	17	-	-
බදු පසු ලාභය		5,085,866	408
අනෙකුත් විස්තීර්ණ ආදායම්		-	-
කාලපරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම්		5,085,866	408

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2014 ජනවාරි 1 දිනට ශේෂය	20	33,293,621	(16,619,812)	16,673,829
වර්ෂයේ අලාභය	-	-	(4,048,921)	(4,048,921)
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	20	33,293,621	(20,668,733)	12,624,908
වර්ෂයේ ලාභය	-	-	408	408
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	20	33,293,621	(20,668,325)	12,625,316
වර්ෂයේ ලාභය	-	-	5,085,866	5,085,866
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	20	33,293,621	(15,582,459)	17,711,182

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	2016 රු.	2015 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහයන්		
බදු පෙර ලාභය / (අලාභය)	5,085,866	408
ගැලපීම්:		
පාරිතෝෂික	16,736,021	1,177,387
පොලී ආදායම්	-	(159,150)
කාරක ප්‍රාග්ධන ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)	21,821,887	1,018,645
කාරක ප්‍රාග්ධන ගැලපීම්:		
තොග අඩුවීම	779,270	3,389,376
වෙළෙඳ සහ වෙනත් ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(5,581,938)	(3,122,420)
තැන්පතු සහ අත්තිකාරම් අඩුවීම /(වැඩිවීම)	1,628,300	336,550
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම /(අඩුවීම)	(13,917,929)	1,244,355
	(17,092,297)	1,847,861
මෙහෙයුම්වලින් ජනිත වූ මුදල්	4,729,589	2,866,506
පාරිතෝෂික ගෙවීම්	(992,210)	(1,241,855)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත/(භාවිත) ශුද්ධ මුදල්	3,737,379	1,624,651
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල්		
දේපළ, පිරියත හා උපකරණ මිලට ගැනීම්	(5,145,012)	(1,164,594)
ස්ථාවර තැන්පතුවල ආයෝජන	(46,168)	(159,150)
පොලී ලැබීම්	-	159,150
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිත ශුද්ධ මුදල්	(5,191,180)	(1,164,594)
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)	(1,453,800)	460,057
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	(2,086,389)	(2,546,446)
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	(3,540,189)	(2,086,389)
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය		
අතැති මුදල්	50,095	30,000
බැංකු අයිරාව	(3,590,284)	(2,116,389)
	(3,540,189)	(2,086,389)

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා පැහැදිලි කිරීමේ සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 පිහිටීම සහ නීතිමය රාමුව

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ සංස්ථාපිතව ක්‍රියාත්මක වන සීමිත වගකීම් සහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය නො. 73, මිනුවන්ගොඩ පාර, ඒකල, ජාඇල යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයද එම ස්ථානයේම පිහිටා ඇත.

සමාගම 2001 වර්ෂයෙහි සංස්ථාපිත කරන ලදී.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරීත්වයේ ස්වභාවය

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ බොඩි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයේ නිරතවේ.

1.3 සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 89කි. (2015 දෙසැම්බර් 31 -75)

1.4 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2018 සැප්තැම්බර් 19 නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS) සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සකස් කර ඇත.

2.2 මිනුම්කරණ පදනම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

2.3 සංසන්දනාත්මක වටිනාකම්

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි පසුගිය වර්ෂයේ සංඛ්‍යා සහ ප්‍රධාන තොරතුරු අවශ්‍ය විටෙක නැවත වර්ගීකරණය කර ඇත.

2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථිකයේ ව්‍යවහාර මුදල් ඒකකය මගින් වන අතර (ක්‍රියාකාරී මුදල්) ආසන්නතම රුපියල් අගයට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (රු.) ය.

2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

SLFRSවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන ඇස්තමේන්තුව සංශෝධනය කරන කාල සීමාව තුළ සහ බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකදී හඳුනා ගැනේ.

2.6 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මුල්‍ය ප්‍රකාශනවල වෙන් වෙන්ව ඉදිරිපත් කරනු ලැබේ. අසමාන ස්වභාවයේ අයිතමයන් හෝ කාර්යයන් ප්‍රමාණාත්මක නොවන දෑ ලෙස සලකයි නම් පමණක් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලබයි.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

සමාගමේ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද SLFRS වලට අනුකූලව සකස් කර ඇත. මෙම මුල්‍ය ප්‍රකාශන සැකසීමේදී යෙදෙන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් හැර ඉදිරිපත් කරන ලද සියළුම වර්ෂ සඳහා අඛණ්ඩව යොදා ගෙන ඇත.

3.1 විදේශ මුදල් ගනුදෙනු/පරිවර්තන

විදේශීය ව්‍යවහාර මුදලින් කරනු ලබන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවූ අවස්ථාවේ පැවැති විනිමය අනුපාතික මත වාර්තා කරන දිනයේ ශ්‍රී ලංකා රුපියලට පරිවර්තනය කරනු ලබයි. මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කරන දිනට විදේශ මුදල්වලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් එම දිනයේ විනිමය අනුපාත තීරණය මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ. පරිවර්තනය මත පැන නගින විදේශ විනිමය වෙනස්කම් ලාභ හෝ අලාභය තුළ හඳුනා ගැනේ. ඓතිහාසික පිරිවැයෙන් ප්‍රකාශ කර ඇති විදේශ මුදල්වලින් සඳහන් වන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්, ගනුදෙනුව සිදු වූ දිනට පැවැති විදේශ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ.

වත්කම් සහ තක්සේරු පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම්, සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුළදී හෝ වාර්තා කළ දින සිට වර්ෂයක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉතා කෙටි කලකින් මුදල් බවට පත්කළ හැකි වත්කම් වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසරක කාල සීමාවකින් ඔබ්බට සමාගම තබා ගැනීමට අදහස් කරන ඒවා වේ.

3.2 මුල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම, එම වත්කම්වල හානිකරණයක් සිදුවී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ. හානිකරණයක් සිදුවිය හැකි බවට කිසියම් ඇඟවීමක් තිබේ නම්, බලපෑමට ලක් වූ කිසියම් වත්කමක (හෝ අදාළ වත්කම් සමූහයක) අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කර එහි ධාරන අගය සමඟ සංසන්දනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අඩු නම්, ධාරන අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි අගය දක්වා අඩු කරනු ලබන අතර, හානිකරණයේ ලාභය හෝ අලාභය ක්ෂණිකව හඳුනා ගැනේ.

සාමාන්‍යයෙන්, සෑම වාර්තාකරන දිනයකදීම, එක් එක් තොග අයිතමයේ (හෝ සමාන අයිතම සමූහයක්) ධාරන අගය එහි විකුණුම් මිල පිරිවැයෙන් අඩුකර හානිකරණ සඳහා තක්සේරුව සම්පූර්ණ කිරීමට සහ විකිණීමට සංසන්දනය කිරීම කරනු ලැබේ. කිසියම් තොතග අයිතමයක් (හෝ ඒ හා සමාන අයිතම සමූහයක්) හානිකරණය වී ඇත්නම්, එහි ධාරන අගය විකුණුම් මිලෙන් පිරිවැය දක්වා අඩු කර සම්පූර්ණ කිරීමට සහ විකිණීමට සිදු වන අතර, ලාභ හෝ අලාභය තුළ හානිකරණ පාඩුවක් ක්ෂණිකව හඳුනා ගැනේ.

3.3 මූල්‍ය මෙවලම්

මූල්‍ය වත්කම්

3.3.1 වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ මූලිකව හඳුනාගනු ලබන්නේ ගනුදෙනු මිලටය. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ මූලිකව හඳුනාගනු ලබන්නේ ගනුදෙනු මිලටය. බොහෝ විකුණුම් සිදු කරනු ලබන්නේ සාමාන්‍ය ණය කොන්දේසි මත වන අතර ලැබිය යුතු දෑ සඳහා පොලී දරනු නොලබන අතර ලැබිය යුතු මුදල් වට්ටම් නොකළ ප්‍රමාණයෙන් අගය කරනු ලැබේ. සාමාන්‍ය ණය කොන්දේසිවලින් ඔබ්බට ණය දීර්ඝ කරන විට, ලැබිය යුතු මුදල් සළුල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ වියදම් මත මනිනු ලැබේ. එක් එක් සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී, මුදල් ආපසු ලබාගත නොහැකි බවට කිසියම් විෂයානුබද්ධ සාක්ෂි තිබේද යන්න තීරණය කිරීම සඳහා වෙළඳ ලැබිය යුතු දෑ හි ධාරන අගය සමාලෝචනය කෙරේ. එසේ නම්, හානිකරණ පාඩුව ලාභ හෝ අලාභය තුළ වහාම හඳුනා ගැනේ.

3.3.2 මූල්‍ය වත්කම් හානිකරණය

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ සාධාරණ වටිනාකමකින් මනිනු නොලබන මූල්‍ය වත්කම්වල ප්‍රමාණය හානිකරණය පිළිබඳ විෂයානුබද්ධ සාක්ෂි තිබේද යන්න තීරණය කිරීම සඳහා සමාලෝචනය කෙරේ. එසේ නම්, ලාභය හෝ අලාභය තුළ අලාභහානි පාඩුවක් ක්ෂණිකව හඳුනාගෙන ඒ අනුව මූල්‍ය වත්කම්වල ධාරන අගය අඩු කරනු ලැබේ.

3.3.3 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමානකම්වලට අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ මාස තුනක හෝ ඊට අඩු මුල් කල්පිරීමක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඇතුළත් වේ. බැංකු අයිරාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම බැරකම් යටතේ දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය" භාවිතා කර සකස් කර ඇත.

මූල්‍ය වගකීම්

3.3.4 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව හඳුනාගනු ලබන්නේ ගනුදෙනු මිලටය (ගනුදෙනු පිරිවැය ඇතුළුව). වෙළඳ ගෙවීම් සාමාන්‍ය ණය කොන්දේසි මත බැඳීම් වන අතර පොළී දරනු නොලබයි. පොළී දරන වගකීම් පසුව සඵල පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැය මත මනිනු ලැබේ.

3.3.5 බැංකු අයිරා

අයිරා ඉල්ලුම මත සම්පූර්ණයෙන් ආපසු ගෙවිය හැකි සහ මූලිකව මනිනු ලබන අතර පසුව මුහුණත වටිනාකමින් ප්‍රකාශ කරනු ලැබේ.

වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත ගෙවීම සඳහා හෝ වාර්තා කළ දින සිට වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වර්ෂයකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස සමාගමට නෛතික හෝ නිර්මාණාත්මක බැඳීමක් ඇති විට ප්‍රතිපාදන සහ වගකීම් පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත.

3.4 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

සමාගමට නිශ්චිත ප්‍රතිලාභ සහ අර්ථ දක්වා ඇති දායක සැලසුම් යන දෙකම ඇත. අර්ථ දක්වන ලද දායක සැලැස්ම වනාහි සමාගම විසින් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන විශ්‍රාම වැටුප් සැලැස්මක් වන අතර සියලුම සේවකයින්ට ගෙවීමට ප්‍රමාණවත් වත්කම් අරමුදල සතුව නොමැති නම් වත්මන් සහ පෙර කාල පරිච්ඡේදවල සේවක සේවයේ වැඩිදුර දායක මුදල් ගෙවීමට නෛතික හෝ සාධනීය බැඳීමක් නොමැත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන විශ්‍රාම වැටුප් සැලැස්මකි. සාමාන්‍යයෙන් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සේවකයෙකු විශ්‍රාම යාමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණයක් සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී.
(අ) නිර්වචිත දායකත්ව සැලසුම්

- සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ) සහ
- සේවක භාරකාර අරමුදල (සේ.භා.අ)

සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල් දායක මුදල් සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයන් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූලව අදාළ දායක මුදල්වලින් ආවරණය කෙරේ.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිතය
සේවකයාගේ සේවයේ පළමු වර්ෂයේ සිට විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ විලම්භීත වගකීම් යටතේ මෙම අයිතමය දක්වා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතට අනුව, සේවකයකුට වගකීම පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. පාරිතෝෂිකය සඳහා බාහිරින් අරමුදල් සපයන්නේ නැත.

3.5 අසම්භාව්‍යයන් සහ ප්‍රාග්ධන බැඳීම්

වාර්තා කරන දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල අනාවරණය කර ඇත.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

3.6 ආදායම් හඳුනාගැනීම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාවේ ප්‍රමාණයට ආදායම හඳුනාගෙන ඇති අතර, ආදායම සහ ඒ ආශ්‍රිත පිරිවැය හෝ දැරීමට සිදුවනු ඇතැයි විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ලැබුණු හෝ ලැබිය යුතු සලකා බැලීමේ සාධාරණ වටිනාකමින් ආදායම මනිනු ලැබේ.

(අ) **අළුත්වැඩියා ආදායම**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ බඳ අළුත්වැඩියා කිරීමෙන් ලැබෙන ආදායම, සේවා අවසන් කිරීම මත පදනම්ව සේවා සපයන කාල සීමාව තුළ හඳුනාගෙන සත්‍ය වශයෙන් සිදුකළ සේවාව මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

(ආ) **පොලී**

සඵල පොලී ක්‍රමය භාවිතයෙන් පොලී ආදායම හඳුනා ගැනේ.

3.7 වියදම් හඳුනාගැනීම

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ලැබීමේ ආදායමට අයකර ඇත.

3.8 මූල්‍ය පිරිවැය

ණය ගැනීම් සම්බන්ධව දරනු ලබන සියලුම පොලී සහ අනෙකුත් වියදම් මූල්‍ය පිරිවැයේ කොටසක් ලෙස වියදම් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	සටහන්	31.12.2016	31.12.2015
		රු.	රු.
4 තොග			
නොනිමි වැඩ		5,336,112	1,670,009
අමතර කොටස්		10,157,320	14,596,046
ඉන්ධන තොග		-	6,647
		15,493,432	16,272,702
5 වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ			
වෙළෙඳ ණයගැතියෝ		10,486,133	4,858,027
පොලී		-	46,168
		10,486,133	4,904,195
6 තැන්පතු සහ අත්තිකාරම්			
තැන්පතු		-	4,000
අත්තිකාරම්	6.1	728,076	2,352,376
		728,076	2,356,376
6.1 අත්තිකාරම්			
උත්සව අත්තිකාරම්		725,076	405,376
භිග වැටුප් සඳහා අත්තිකාරම් (රාජකාරී කරන කාර්යමණ්ඩලය)		3,000	1,693,000
භිග වැටුප් සඳහා අත්තිකාරම් (විශ්‍රාමික කාර්යමණ්ඩලය)		-	254,000
	6	728,076	2,352,376
7 මුදල් හා මුදල් සමාන දෑ			
සුළු මුදල්		50,095	30,000
8 ප්‍රකාශිත ප්‍රාග්ධනය			
නිකුත් කළ හා සම්පූර්ණයෙන් ගෙවා නිමි සාමාන්‍ය කොටස් 2		20	20
9 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික			
වර්ෂ ආරම්භක වෙන්කිරීම්		2,365,893	2,430,361
වර්ෂය සඳහා වෙන්කිරීම්		16,736,021	1,177,387
		19,101,914	3,607,748
වර්ෂය තුළ ගෙවීම්		(992,210)	(1,241,855)
වර්ෂ අවසාන වෙන්කිරීම්		18,109,704	2,365,893

	සටහන්	31.12.2016 Rs.	31.12.2015 Rs.
10 වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ			
වෙළෙඳ ණයහිමියන්		-	840,292
උපචිත වියදම් හා වෙනත්	10.1	3,667,200	16,744,837
		3,667,200	17,585,129
10.1 උපචිත වියදම් හා වෙනත්			
වැටුප් හා වේතන		1,348,061	977,444
සේවක අර්ථසාධක අරමුදල		-	520,832
සේවක භාරකාර අරමුදල	-	70,763	
අතිකාල		-	77,740
ප්‍රසාද දීමනා		194,767	95,103
කොන්ත්‍රාත් වේතන		269,856	179,122
වාහන දීමනා - සභාපතිගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ		50,000	20,000
දුරකතන දීමනා - සභාපතිගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ		4,250	-
ඉන්ධන දීමනා - සභාපතිගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ		16,150	10,766
සේවක සුබසාධක සංගමය - ඒකල		8,200	6,300
සේවක සුබසාධක සංගමය - ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය		1,400	1,400
සේවක සුබසාධක සංගමය - ලක්දිව		9,400	7,000
දඩ අරමුදල		104,071	43,781
සංගම්		16,805	8,805
සේවක ණය (බැංකු ණය)		385,734	375,064
විගණන ගාස්තු		69,990	109,990
දුරකතන		11,773	8,342
විදුලිය		115,885	205,275
ආරක්ෂක		224,800	187,360
මුද්දර ගාස්තු		-	2,420
හිග වැටුප් සඳහා අත්තිකාරම් (රාජකාරී කරන කාර්යමණ්ඩලය)		-	10,512,055
හිග වැටුප් සඳහා අත්තිකාරම් (විශ්‍රාමික කාර්යමණ්ඩලය)		-	1,958,737
හිග සේවක අර්ථසාධක අරමුදල		686,054	859,411
හිග සේවක භාරකාර අරමුදල		93,293	181,350
රඳවා ගැනීමේ බදු		-	5,374
ආපනශාලා තැන්පතු		-	10,000
ටෙන්ඩර් තැන්පතු ආපසු ගෙවුම්		40,000	276,692
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රධාන කාර්යාලය		16,711	33,711
	10	3,667,200	16,744,837

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අඛණ්ඩව.

	සටහන්	2016 රු.	2015 රු.
11 ආදායම			
අළුත්වැඩියා ආදායම්		73,340,474	34,648,919
සුන්බුන් විකුණුම්		-	8,860
		73,340,474	34,657,779
12 විකුණුම් පිරිවැය			
වර්ෂයේ ආරම්භක නොනිමි වැඩ		1,670,009	2,593,579
නිෂ්පාදන පිරිවැය	12.1	68,235,701	36,981,177
වර්ෂයේ අවසාන නොනිමි වැඩ		(5,336,112)	(1,670,009)
		64,569,598	37,904,747
12.1 නිෂ්පාදන පිරිවැය			
සෘජු ද්‍රව්‍ය		27,718,329	10,985,171
සෘජු ශ්‍රමය	12.1.1	26,907,434	19,635,312
සේවක අර්ථසාධක අරමුදල		2,495,424	2,151,132
සේවක භාරකාර අරමුදල		623,856	537,783
බස්රථ අළුත්වැඩියා සහ පින්තාරු (බාහිර)		7,361,306	2,707,230
දිරි දීමනා		3,129,352	964,549
	12	68,235,701	36,981,177
12.1.1 සෘජු ශ්‍රමය			
වැටුප් හා වේතන		16,899,994	8,735,358
හිඟ වැටුප්		34,390	282,936
දීමනා		2,330,000	4,787,280
ජීවන වියදම් දීමනා		4,836,000	4,264,728
අතිකාල		312,474	158,796
කොන්ත්‍රාත් වේතන		2,845,064	1,544,091
	12.1	26,907,434	19,635,312

	සටහන්	2016 Rs.	2015 Rs.
13 අනෙකුත් ආදායම්			
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන		24,000,000	22,000,000
මගී ප්‍රවාහන		420,549	354,176
ග්‍රේට් වෝල් අමතර කොටස්		-	3,938
පොලී		-	159,150
ටෙන්ඩර් ගාස්තු		5,000	3,000
විවිධ		31,444	46,062
අබලි වික්‍රණුම්		5,866	-
සැපයුම්කරුවන් ලියාපදිංචි ආදායම්		49,500	-
		24,512,359	22,566,326
14 පරිපාලන වියදම්			
වැටුප් හා වේතන	14.1	8,732,923	7,572,447
අධ්‍යක්ෂවරුන්ගේ වැටුප්	14.2	1,335,633	315,243
සේවක අර්ථසාධක අරමුදල		1,551,241	1,195,783
සේවක භාරකාර අරමුදල		387,810	298,946
දීමනා		1,538,587	2,575,926
ගෙවිය යුතු ශේෂ කපා හැරීම්	14.3	(14,187,676)	-
ලැබියයුතු ශේෂ කපා හැරීම්	14.4	1,957,647	-
පාරිතෝෂික		16,736,021	1,177,387
කාර්යමණ්ඩල සුභසාධන		142,804	23,887
වෛද්‍ය වියදම්		-	2,390
විදුලිය		1,276,127	923,513
දුරකතන		118,728	95,091
වරිපනම් හා බදු		85,080	150,458
රක්ෂණ		44,217	2,389
ආරක්ෂක සේවා		3,954,200	3,501,340
අළුත්වැඩියා සහ නඩත්තුව		2,054,130	122,384
ඉන්ධන		815,961	499,930
ලිපිද්‍රව්‍ය		263,138	143,176
පරිවර්තන ගාස්තු		10,000	-
ගිවිසුම් ගාස්තු		12,141	-
තැපැල්		4,128	2,890
විගණන ගාස්තු		100,000	69,990
ලේකම් ගාස්තු		75,000	45,000

	සටහන්	2016 රු.	2015 රු.
14 පරිපාලන වියදම්			
නීතිමය ගාස්තු		47,708	84,500
දඩ සහ අධිභාර - සේ.භා.අ		7,572	80,936
පරිත්‍යාග		5,000	-
සනීපාරක්ෂක		128,711	91,989
විවිධ		243,041	4,934
දැන්වීම් සහ ප්‍රචාරණ		34,152	-
		27,474,024	18,980,529
14.1 වැටුප් හා වේතන			
වැටුප් හා වේතන		5,974,911	5,131,999
හිඟ වැටුප්		8,495	159,789
ජීවන වියදම් දීමනාව		2,704,780	2,238,600
අතිකාල		70,612	108,593
අඩුකළා නොගෙවූ වැටුප්		(25,875)	(66,534)
	14	8,732,923	7,572,447
14.2 අධ්‍යක්ෂ වරුන්ගේ පාරිශ්‍රමික			
ඉන්ධන දීමනාව		193,800	107,993
අනෙකුත් දීමනා		1,073,000	197,333
දුරකතන ගාස්තු		53,833	9,917
අධ්‍යක්ෂ වරුන්ගේ ගමන් වියදම්		15,000	-
	14	1,335,633	315,243
14.3 ගෙවිය යුතු ශේෂ කපා හැරීම			
ගෙවිය යුතු හිඟ සේ.අ.අ.		859,411	859,411
ගෙවිය යුතු හිඟ සේ.භා.අ.		181,350	181,350
හිඟ වැටුප් හා වේතන - රාජකාරි කරන කාර්යමණ්ඩලය		10,512,055	10,512,055
හිඟ වැටුප් හා වේතන - විශ්‍රාම ගිය කාර්යමණ්ඩලය		1,958,737	1,958,737
රදවා ගැනීමේ බදු		5,374	5,374
ආපන ශාලා තැන්පතු		10,000	10,000
අගරු වෙක්පත්		276,692	276,692
වෙළෙඳ ණය හිමියන්		306,317	306,317
ගෙවියයුතු අතිකාල		77,740	77,740
		14,187,676	14,187,676

	සටහන්	2016	2015
		රු.	රු.

14.4 ලැබිය යුතු ශේෂ කපා හැරීම

විශ්‍රාම ගිය කාර්යමණ්ඩලයේ හිඟ වැටුප් සඳහා අත්තිකාරම්	254,000	254,000
රාජකාරි කරන කාර්යමණ්ඩලයේ හිඟ වැටුප් සඳහා අත්තිකාරම්	1,693,000	1,693,000
උසාවි නැන්පතු	4,000	4,000
ඉන්ධන තොග	6,647	6,647
	1,957,647	1,957,647

15 බෙදාහැරීමේ පිරිවැය

ගමන් වියදම් හා ප්‍රවාහන වියදම්	72,127	38,269
වාහන කුලී	600,000	88,000
	672,127	126,269

16 මූල්‍ය පිරිවැය

බැංකු අයිරා පොලී	34,218	168,714
බැංකු ගාස්තු	17,000	43,438
	51,218	212,152

17 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම	-	-

18 වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසාන් දිනට පසු සිදුවූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වූ වාර්තාකරණ කාලසීමාව අවසන් වීමෙන් පසුව සිදු වූ සිදුවීම් නොමැත.

19 අසම්භව්‍ය බැරකම් සහ ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දිනට ප්‍රමාණාත්මක අසම්භව්‍ය බැරකම් හෝ ප්‍රාග්ධන බැඳීම් නොතිබුණි.

මගේ අංකය: CTP/A/LEC/FA/06/2016/05 2019 අප්‍රේල් 03 දින.

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ
කොටස්හිමියන් වෙත.

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

සීමාසහිත ලක්දිව ඉංජිනේරු (පුද්ගලික)සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී.

මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) දේපළ, පිරියත හා උපකරණවලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් හෝ සවිස්තරාත්මක උපලේඛන නොමැතිවීම හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.13,435,435 ක වටිනා දේපළ පිරියත හා උපකරණවල තක්සේරුව, නිරවද්‍යතාව හා පරිපූර්ණත්වය සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. තවද, දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 16 මගින් දක්වා ඇති අනාවරණය කිරීමේ අවශ්‍යතාවට අනුකූලව, දේපළ, පිරියත හා උපකරණ ක්ෂයකිරීම පිළිබඳ සමාගම විසින් අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාගම විසින් 2016 දෙසැම්බර් 31 දින භාණ්ඩ පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.15,493,432 ක් වටිනා භාණ්ඩවල තක්සේරුව, නිරවද්‍යතාව හා

පරිපූර්ණත්වය සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. තවද, භාණ්ඩ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය-LKAS 2 අනුකූලව, නිකුත් නොවී ඇති භාණ්ඩවල පාඩු හදුනා ගැනීමටද සමාගම අසමත් වී තිබුණි.

(ඇ) ග්‍රේට්වෝල් බස් ව්‍යාපෘතිය සඳහා 1993 වර්ෂයේදී රු.12,970,875 ක් වටිනා භාණ්ඩ සමාගම වෙත ලැබී තිබුණි. කෙසේ වුවද, එම භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දිනට මෙම භාණ්ඩවල පැවැත්ම හා ඒවායේ තක්සේරුව පිළිබඳ භාණ්ඩ ලේඛන තක්සේරු වාර්තා හෝ ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා දීමටද සමාගම අසමත් වී තිබුණි.

(ඈ) පරිපාලන වියදමට එදිරිව උපචිත වියදම් හා වෙනත් ගෙවිය යුතු මුදල්, ආපනශාලා තැන්පතු, ආපසු එවූ චෙක්පත් හා වෙළඳ ණයහිමියන් සඳහා වන අනුපිළිවෙළින් රු.13,594,667, රු.10,000 , රු.276,692 හා රු.306,317 ක් සමාගම විසින් ලියා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිපාලන වියදම රු.14,187,676 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) මෙම සමාගම ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීම සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම යන ඡේදයේ විස්තර කරන ලද කරුණුවල වැදගත්කම හේතුකොටගෙන විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) ඉහත දක්වා ඇති පරිදි, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගෙන නොමැති බවත්, සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා නොමැති බවත් මා දරන්නාවූ මතය වේ.

පාර්ලිමේන්තුව වෙත වාර්තාකිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච්.එම්. ගාමිණි විජේසිංහ
විගණකාධිපති

MINISTRY OF TRANSPORT & HIGHWAYS

LAKDIVA ENGINEERING COMPANY (PVT) LTD.

NO. 73, MINUWANGODA ROAD, EKALA, JA-ELA, SRI LANKA

Tel: 011-2236530, 2236458 Fax: 011-2236764 E-mail -lakdiwaengco@gmail.com

මගේ අංකය - LEC/AC/AQU/01/2016

2019/05/20

විගණන අධිකාරී,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

නො.306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල.

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2019/04/03 දින අංක - සීටීපී/ඒ/එල්ටීසී/එෆ්ඒ/2016/05 දරණ විගණකාධිපති වාර්තාව සම්බන්ධවයි.

මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) පිළිගනිමි. ඉදිරියේදී දේපළ පිරියත හා උපකරණ ක්ෂයකිරීම පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් හා සවිස්තරාත්මක උප ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරමි.

(ආ) පිළිගනිමි. ඉදිරියේදී සමාගමේ භාණ්ඩ පිළිබඳ භෞතික සථ්‍යාපනය සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි.

(ඇ) පිළිගනිමි. භාණ්ඩ වල පැවැත්ම හා ඒවායේ තක්සේරුව පිළිබඳ භාණ්ඩ ලේඛන, තක්සේරු වාර්තා සකස් කිරීමට කටයුතු කරමි.

(ඇ) පිළිගනිමි.ඉදිරියේදී අදාල වැරදි නිවැරදි කිරීමට පියවර ගනිමි.

(ඉ) පිළිගනිමි. ඉදිරියේදී අදාල බදු ගෙවීම් සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය පියවර ගනිමි.

බී.ආර්.එල්.ගුණවර්ධන

සභාපති

සී/ස ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

ඒකල

ජා-ඇල